ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1)244-9070
ඉ-තැපෑල: ElmsC@state.gov http: //srilanka.usembassy.gov

Release no:20121024

එක්සත් ජනපද තානාපතිනිය මඩකලපුවේ පාසල් දෙකක් විවෘත කරයි

ඔක්තෝබර් 24, 2012 : එක්සත් ජනපදයේ මූල්‍ය ආධාර නිසා නැගෙනහිර ග්‍රාමීය ශිෂ්‍යයන් 1,200 කට දැන් වැඩි දියුණු කළ අධ්‍යාපන පහසුකම් ලැබී තිබේ. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) හා එක්සත් ජනපද ශාන්තිකර මූලස්ථානයෙන් (PACOM) සැපයූ අරමුදල් වලින් පංති කාමර, ගුරු නිවාස හා වැසිකිළි ආදිය ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදි. ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනි මිෂෙල් සිසොන් මඩකලපු ප්‍රදේශයේ කළ සංචාරයකදී පොරතිව්පත්තු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කළුමුන්තන්වේලි පොදු දෙමළ මිශ්‍ර පාසලත් පඩ්ඩිපලෙයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මුනෙයිකඩු විවේකානන්ද පාසලත් විවෘත කළාය. රටේ දීර්ග කාලයක් පැවති ගැටුම් වලදී මෙම පාසල් දෙකටම බෙහෙවින් හානි සිදුවී තිබුණි.

විවෘත කිරීමේ උත්සවයේදී කථා කරමින් තානාපතිනි සිසොන් මෙසේ ප්‍රකාශ කළාය. “පසුගිය අවුරුදු විසිහයක කාලය තුළ නැගෙනහිර ජනතාව මුහුණ පෑ අභියෝග ගැන එක්සත් ජනපද රජයට අවබෝධයක් තිබේ. මෙහි අපේ කටයුතුවල වැදගත් ම කොටසක් වන්නේ ඊළඟ පරම්පරාවට ගැටුමෙන් සාමය කරා යෑමට සහාය වීමයි. බොහෝ ග්‍රාමීය පෙදෙස්වල ජනතාවට බාධාවකින් තොර ව අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගැනීම දුෂ්කර වී තිබුණි. යුද්ධය අවසන් වීමෙන් පසුව ජනතාවට මෙම සේවාවන් ලබා දීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරන අතර අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය(USAID) හා එක්සත් ජනපද ශාන්තිකර මූලස්ථානයේ (PACOM) ආධාර මගින් මෙම කටයුතු වලට සහය වීමට ලැබීම ගැන අපි සතුටු වෙමු.“

2008 වර්ෂයේ සිට අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය(USAID) හා එක්සත් ජනපද ශාන්තිකර මූලස්ථානය(PACOM) , මේ රටේ උතුරු හා නැගෙනහිර ගැටුමෙන් විනාශ වූ පාසල්වලට ආධාර කර ඇත. මෙම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා අලුත් පහසුකම් ලබා දීම නිසා පාසල්වලට වැඩිපුර ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමටත් වර්ෂය පුරාම ඉගැන්වීම සහතික කිරීමටත් හැකි තිබේ.

*අවුරුදු 50ක පමණ කාලයක් තිස්සේ ඇමරිකන් ජනතාව, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය **(USAID)** මගින් ලොව පුරා දියුණුවන රටවලට සංවර්ධන හා මානුෂීය ආධාර සපයා තිබේ. 1956 වර්ෂයේ සිට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය **(USAID)** ශ්‍රී ලාංකීය ජනතාවගේ යහපත සඳහා ඩොලර් බිලියන දෙකකට වැඩි ප්‍රමාණයක් ආයෝජනය කර ඇත.*